මාධ්‍ය තුළ ඇතැම් විටකදී භාවිතා වන නිෂේධනාත්මක නාමකරණයන් ඔස්සේ, ශිෂ්ට සම්පන්න චින්තනයක් දියුණු කිරීම සඳහා බාධාවන් ඇතිවීමත්, යම් යම් සමාජ කොටස් පුනරුත්ථාපනයකින් හෝ යහමගට ගැනීමට ඇති ඉඩ ඇවිරීමටත් හැකියාවක් ඇති බව අපි මීන් පෙරද පෙන්වා දී ඇත්තෙමු.
එසේ බලන කල 'කුඩ්ඩා/කුඩුකාරයා' වැනි යෙදුම් පුවත්පත් තුළ භාවිතා වීම කෙතරම් යෝග්‍ය වන්නේද යන්න පැනයකි.

එසේම පහත පුවත් වාර්තාවන් සලකා බලන විට, 'කුඩ්ඩා' වැනි යෙදුම් සිරස්තල තුළ පමණක් භාවිතා වී තිබීමත්, පුවත් අන්තර්ගතයන් තුළ ඔවුන්ව 'මත්ද්‍රව්‍ය/මත්කුඩු වලට ඇබ්බැහි වූවන්' ලෙසින් හඳුන්වා තිබීමත් විශේෂත්වයකි. පුවත් වාර්තාවන් සඳහා සිරස්තල යෙදීමේ කාර්යභාරය බොහෝවිට සිදු කරන්නේ පුවත් වාර්තාව ලියූ මාධ්‍යවේදියා නොවන බව අපි දනිමු. එසේ නම් ගැටලුව ඇත්තේ එතැනය.

කුඩ්ඩා/කුඩුකාරයා වැනි යෙදුම් පුවත් සිරස්තල වලින් ද ඉවත් කළ යුතු නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #SundayMawbima #SathiAgaAruna #Lankadeepa